ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

සමාජ අධ්‍යයන අංශය

තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 04 වන මට්ටම

අවසාන පරීක්ෂණය - පළමු අර්ධ වර්ෂය 2023/2024

**DSD4205/SSD2105** - ව්‍යවසාය සහ ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම

කාලයඃ පැය දෙකයි (02)

---

දිනය ඃ **09.12.2023** | වේලාව ඃ ප.ව **1.30** – ප.ව **3.30**

---

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 කි.
- පැහැදිලි අත් අකුරු අපේක්ෂා කෙරේ.

1.

I. ටොඩාරෝ විසින් පැහැදිලි කරන ලද සංවර්ධනයේ මූලික වටිනාකම් විස්තර කරන්න. *(ලකුණු 10)*

II. 'ගෝලීයකරණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවස්ථා මෙන්ම තර්ජන ද ලබා දෙයි'. මෙම ප්‍රකාශය ශ්‍රී ලාංකීය සන්දර්භයට අදාළව සාකච්ඡා කරන්න. *(ලකුණු 15)*

2.

I. 'වෙළඳ යුක්තිය' සංකල්පය පැහැදිලි කරන්න. *(ලකුණු 05)*

II. වෙළඳ ලිබරල්කරණයේ වාසි සාකච්ඡා කරන්න. *(ලකුණු 10)*

III. ටොඩාරෝ විසින් යෝජනා කරන ලද ග්‍රාමීය සංවර්ධනයේ ප්‍රධාන උපාය මාර්ග පැහැදිලි කර, තරුණ සංවර්ධනයට එහි අදාළත්වය ගැන අදහස් දක්වන්න. *(ලකුණු 10)*

3.

I. විධිමත් සහ අවිධිමත් ව්‍යාපාර අතර වෙනස හඳුන්වා දෙන්න. *(ලකුණු 05)*

II. අවිධිමත් සහ කුඩා ව්‍යාපාරවල ප්‍රතිලාභ ගැන සාකච්ඡා කරන්න. *(ලකුණු 10)*

III. අවිධිමත් ව්‍යාපාර මුහුණ දෙන අභියෝග මොනවාද? *(ලකුණු 10)*

4.

I. කුඩා හා අවිධිමත් ව්‍යාපාරවලට සහාය වීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. *(ලකුණු 10)*

II. ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇසුරෙන් ක්ෂුද්‍ර ව්‍යවසාය අංශයේ දියුණුව සඳහා රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය සාකච්ඡා කරන්න. *(ලකුණු 15)*

5.

I. තරුණ ව්‍යවසායක් පිහිටුවීමට පහසුකම් සැලසීමේදී, තරුණ කටයුතු පිළිබඳ වෘත්තීයවෙදියකු (youth worker) සතුව තිබිය යුතු කුසලතා සහ දැනුම පැහැදිලි කරන්න. *(ලකුණු 10)*

II. ව්‍යවසාය සංවර්ධන චක්‍රයට සම්බන්ධ අදියර තුන විස්තර කර එක් එක් අදියර සාක්ෂාත් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 15)*

6.

I. කුඩා ව්‍යවසායක් (SME) ආරම්භ කිරීමට අදාළ සැලසුම් ක්‍රියාවලිය පැහැදිලි කරන්න. *(ලකුණු 05)*

II. කුඩා ව්‍යාපාර අලෙවිකරණයේදී ඔබ අනුගමනය කරන උපාය මාර්ග මොනවාද? *(ලකුණු 10)*

III. කුඩා ව්‍යාපාරයක් ඇගයීමේදී ඔබ අනුගමනය කරන නිර්ණායක පැහැදිලි කරන්න. *(ලකුණු 15)*

7.

I. තරුණ ප්‍රජාව හට ව්‍යාපරයක් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සුදුසු පුහුණු වැඩසටහනක අන්තර්ගතය ඉදිරිපත් කරන්න. *(ලකුණු 10)*

II. කුඩා ව්‍යාපාරිකයන් සතු විය යුතු ගුණාංග පැහැදිලි කරන්න. *(ලකුණු 15)*

8. පහත මාතෘකා වලින් ඕනෑම පහක් (05) ගැන කෙටි සටහන් ලියන්න. *(ලකුණු 05 බැගින්)*

I. ණය සහ ව්‍යුහාත්මක ගැලපීම්
II. ව්‍යවසායකයා
III. ව්‍යවසාය සඳහා 'බාධක
IV. රැකියා විකල්පයක් ලෙස ව්‍යවසාය
V. සමුපකාර වර්ග
VI. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම

***********සියළුම හිමිකම් ඇවිරිණි***********